# කොටියාගල මයිල්ල කන්ද විහාරය පිළිබඳව අධ්‍යයනයක්

එස්. එන්. කුමාරි

පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
nisansala.pera.92@gmail.com

කොටියාගල මයිල්ල කන්ද විහාරය ඉපැරණි සිතුවම් සහිත කටාරම් කොටන ලද ගුහා සංකීර්ණයක් වේ. මොනරාගල කොටියාගල නගරයට නුදුරින් වනය මැද පිහිටා තිබෙන මයිල්ල කන්ද විහරයට ළඟාවීමට ඇති දුෂ්කරතාවය නිසාවෙන් ජනතාවගෙන් දුරස්ව තිබේ. අදින් වසර 40 කට පමණ පෙර මෙහි සිතුවම් සංරක්ෂණය කර ඇති නමුත් එය සාර්ථක මෙන්ම විධිමත්භාවයෙන් තොර බව කිව හැකිය. දැනට දක්නට ලැබෙන සිතුවම් සහ සැතපෙන පිළිමය සහිත ගුහා විහාරය පිළිබඳ මෙතෙක් කිසිදු සාර්ථක පර්යේෂණයක් සිදුකර නොමැති බව සඳහන් කළ හැකිය. හායනයට ලක්ව තිබෙන බිතුසිතුවම් සහ ගුහා විහාරය පිළිබඳව මනා ලෙස නිරීක්ෂණය කොට විධිමත් පර්යේෂණයක් පවත්වා නව තොරතුරු වාර්තා කිරීම මෙන්ම විධිමත්ව අනාගත පරපුර වෙත සංරක්ෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

ක්ෂේත්‍ර ගවේෂණයේ දී ඡායාරූප ගත කිරීම, තොරතුරු ලේඛන ගත කිරීම, පිටපත් කිරීම් මගින් මූලික වශයෙන් තොරතුරු වාර්තාගත කෙරුණි. අනුරාධපුර යුගයට අයත් යැයි උපකල්පනය කළ හැකි සැතපෙන බුදු පිළිමයක් විහාරයට පිවිසිමේදී දක්නට ලැබේ. එය ගඩොල් සහ මැටි උපයෝගී කරගනිමින් නිමවා තිබේ. මෙම පිළිමය සහිත ගුහාවෙහි කටාරම් කොටා තිබෙන අතර ගඩොල් බිත්තියක් මගින් විශාල කටාරම් සහිත ගුහාව කොටස් දෙකකට බෙදා වෙන්කර තිබෙනු දක්නට ලැබේ. මෙම බිත්ති මත සහ බුදු පිළිමය සහිත ගුහාවේ පියස්සේ ද සිතුවම් ඇඳ තිබේ. දහයියා සහ මකුළු මැටි යොදා සකස් කරන බදාමයක් ආලේප කර සිතුවම් ඇඳ තිබේ.

සිතුවම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී පෙනීයන්නේ සිතුවම් ඇඳීම සඳහා බදාම ස්තර කිහිපයක් යොදා තිබෙන බව ය. මෙම සිතුවම් ඇඳ තිබෙන ශෛලීන් සහ අන්තර්ගතය හරහා විවිධ අවධින් තුළ සිතුවම් ඇඳ තිබෙන බව පැහැදිලි වේ. සීගිරි සිතුවම්වලට සම ලක්ෂණ දක්වන අප්සරා රූප ගුහාවේ පියස්ස මත දක්නට ලැබේ. ක්‍රි. පූ. 9-10 සියවස්වලට අයත් මහායාන සංකල්පය මඟින් විදහාපාන බෝධිසත්ත්ව රූපයන් ද මෙම සිතුවම් අතර පැහැදිලිව හඳුනාගත හැකිය. මෙහි දැක්වෙන දුර්ලභ සිතුවම් සහ ගුහා සංකීර්ණය පිළිබඳව විධිමත්ව පර්යේෂණ කටයුතු කිරීමට ඉදිරියටත් බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද : කොටියාගල මයිල්ල කන්ද විහාරය, සිතුවම්, ශෛලීන්